www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප ගාල්ලේ දී මැතිවරන රැස්වීමක් පවත්වයි

## Sri Lankan SEP to hold election meeting in Galle

2009 සැප්තැම්බර් 29

ඔක්තෝබර් 10 දා පැවැත් වීමට නියමිත දකුන් පලාත්සභා මැතිවරන උද්ඝෝෂනයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) ඉරිදා ගාල්ල නගරයේ දී ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීමට නියමිත ය.

මැතිවරනය, ජාතිය ගොඩනැගීමේ "ආර්ථික යුද්ධය" සඳහා ඔහුගේ අත ශක්තිමත් කර ගැනීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් කැඳවුම් කරනු ලැබූ පලාත් සභා ඡන්ද පෙලකින් එකකි. එල්ටීටීඊයට එරෙහි දසක ගනනාවක වාර්ගික යුද්ධය සහ ගැඹුරුවන ගෝලීය බිඳවැටීම මගින් නිෂ්පාදිත තියුනු ආර්ථික අර්බුදයේ කොන්දේසි යටතේ ආන්ඩුව වැඩ කරන ජනතාව මත බර පැටවීමේ ප්‍රයත්නයක යෙදී සිටී.

වතුකරයේ, වරායේ හෝ විදුලි බල මන්ඩලයේ වේවා කම්කරුවෝ හාම්පුතුන්ට, ආන්ඩුවට සහ විශේෂයෙන්ම වෘත්තීය සමිතිවලට එරෙහිව ස්වාධීන අරගලයක් ගෙන යායුතු බව අවබෝධ කර ගනිමින් සිටිති. එවන් අරගලයක්, අන් සියල්ලටමත් වඩා විකල්ප දේශපාලන ඉදිරිදර්ශනයක අවශ්‍යතාවය මතු කරයි.

කම්කරුවන්ට, තරුනයන්ට, ගම්මුන්ට සහ රැකියා විරහිතයන්ට අපගේ රැස්වීමට සහභාගි වන ලෙස සසප ආරාධනය කරනු ලබයි. සියලුම සංස්ථාපිත පක්ෂවල වාර්ගික දේශපාලනයට විරුද්ධවීමේ සහ ජාත්‍යන්තර සමාජවාදය සඳහා පලල් අරගලයක කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ කම්කරු ගොවි ආන්ඩුවක් සඳහා අරගලය වටා ඒකාබද්ධ වීමේ අවශ්‍යතාවය අප විසින් මෙහිදී පැහැදිලි කරනු ඇත.

**ස්ථානය:** ප්‍රවේශාගාරය, ගාල්ල නගර සභාව.

**වේලාව:** ඔක්තෝබර් 4 ඉරිදා සවස 4.00ට

**ප්‍රධාන කථිකයා:** සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්